**යුද්ධ හමුදාධිපති**

**ලුතිනන් ජෙනරාල් ජේ ජයසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී**
**විසින් නිකුත් කරන ලදි.**

---

**<u>හමුදා නියෝග</u>**

**<u>හනි 01/2013</u>** **<u>යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දරුවන් රජයේ පාසල්වලට සහ ආරක්ෂක සේවා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම</u>** **<u>යුසා/පා/පා/8/6/2013</u>**

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දරුවන් රජයේ පාසල්/ආරක්ෂක සේවා විද්‍යාලයේ පළමු වන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමේදී අදාළ කර ගත යුතු ප්‍රතිපත්ති සහ උපදෙස් මෙම හමුදා නියෝගය මගින් ප්‍රකාශයට පත් කෙරේ.

2. අයදුම්පත් කැඳවීමේදී පහත සඳහන් සුදුසුකම් සපුරාලන අයවලුන්ට අයදුම් කළ හැක:

අ. සක්‍රිය සේවයේ යෙදී සිටින නිත්‍ය සහ ස්වේච්ඡා හමුදාවන්හි සියලුම සාමාජිකයින්.

ආ. මියගිය නිත්‍ය හා ස්වේච්ඡා හමුදා සාමාජිකයන්ගේ දරුවන් සිටී නම් ඔවුන්ගේ භාරකරුවන්ට.

ඇ. ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිතව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වූ යුද්ධ හමුදා නිත්‍ය හා ස්වේච්ඡා හමුදා සාමාජිකයින් (විශ්‍රාම ගිය දින සිට ඉදිරියට උපරිම වසර 06 ක් දක්වා).

ඈ. සිවිල් පදනම මත හමුදාගත කර ඇති අයවලුන්.

ඉ. දරුවා ඇතුළත් කිරීමට බලාපොරොත්තුවන වර්ෂයට පෙර වර්ෂයේ ජනවාරි මස 01 වන දිනෙන් පසු විශ්‍රාම ලබා ඇති අයවලුන්.

ඊ දරුවන් නොමැති යුද්ධ හමුදා සාමාජිකයින් වෙනුවෙන් ඔවුන් වෙතත් දෙමාපියන්ගේ දරුවන් නිත්‍යානුකූලව තම භාරයට ගෙන රැකබලා ගන්නේ නම් එම දරුවන් වෙනුවෙන් අයදුම්පත් ඉදිරිපත් කළ හැක. (එම දරුවා නිත්‍යානුකූලව තම භාරයට ගෙන පාසල වෙත ඇතුළත් කරන වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනට අවම වශයෙන් වසර 03 ක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය).

→ 3. සුදුසුකම්

3. සුදුසුකම් සපුරා ඇති අයවලුන් තම දරුවා ඇතුළත් කිරීමට බලාපොරොත්තුවන වර්ෂයට පෙර වර්ෂයේ පහත සඳහන් කාලසීමාවන් තුළ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

අ. සියලුම රෙජිමේන්තු මධ්‍යස්ථාන විසින් අදාල වර්ෂයේ පෙබරවාරි මස 01 දින සිට මාර්තු 15 දින දක්වා කාලය තුළදී මෙයට ඇමුණුම "අ" වශයෙන් ඉදිරිපත් කර ඇති ආකෘති පත්‍රයට අනුව පහත සඳහන් පරිදි වෙන් වෙන් වශයෙන් මූලික විස්තර ඉදිරිපත් කළ යුතුය.

(1) දැනට සේවයේ යෙදී සිටින සහ විශ්‍රාමික අයවලුන්.

(2) ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිතව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වූ අයවලුන්.

(3) මියගිය අයවලුන්.

(4) කාලාතුයා යුද්ධ හමුදාවේ දැනට සේවයේ යෙදී සිටින අයෙකු නම් පමණක් ඔහුගේ/ඇයගේ විස්තර.

ආ. රෙජිමේන්තු මධ්‍යස්ථාන විසින් මූලික විස්තර ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන්ගේ පහත සඳහන් අයදුම්පත් සම්පූර්ණ කර දක්වා ඇති පිටපත් ගණනින් ඊයට අදාල සහතික පත් සමග ළකුණු ඇතුළත් මණ්ඩල වාර්තා ජූලි මස 15 වන දිනට ප්‍රථම ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

(1) අධ්‍යාපන අමාත්‍යාංශ අයදුම්පත - පිටපත් 03 යි.
(ඇමුණුම "ආ" වශයෙන් ඉදිරිපත් කර ඇත)

(2) යුද්ධ හමුදා අයදුම්පත - පිටපත් 01 යි.
(ඇමුණුම "ඇ" වශයෙන් ඉදිරිපත් කර ඇත)

(3) ආරක්ෂක සේවා විද්‍යාල අයදුම්පත - පිටපත් 01 යි.
(ඇමුණුම "ඈ" වශයෙන් ඉදිරිපත් කර ඇති අතර, ආරක්ෂක සේවා විද්‍යාලයට ළමුන් ඇතුළත් කිරීමට අවශ්‍ය අයවලුන් සඳහා පමණක් මෙය අදාළ වේ)

ඇ. එම ළකුණු ඇතුළත් මණ්ඩල වාර්තා ඉදිරිපත් කිරීමේදී එහි විස්තර පහත සඳහන් පරිදි වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතුය.

(1) දැනට සේවයේ යෙදී සිටින සහ විශ්‍රාමික අයවලුන්.

(2) ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිතව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වූ අයවලුන්.

→ (3) මියගිය

(3) මියගිය අයවලුන්.

4. අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු සනාථ කිරීම සඳහා අයදුම් පත්‍රය සමග පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු වේ.

අ. පදක්කම්/පළඳනා/ප්‍රසාදනා පිරිනැමීම වෙනුවෙන් පලකරන ලද ගැසට් පත්‍රය හෝ විශේෂ හමුදා නියෝගයේ ඡායාස්ථ පිටපතක් (අණදෙන නිලධාරී විසින් සහතික කර තිබිය යුතුය).

ආ. යුද්ධ හමුදා හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්. (අණදෙන නිලධාරී විසින් සහතික කර තිබිය යුතුය).

ඇ. ආසන්නම මාසයේ වැටුප් පත්‍රිකාවෙහි ඡායා පිටපතක්. (අණදෙන නිලධාරී විසින් සහතික කර තිබිය යුතුය).

ඈ. අණදෙන නිලධාරී විසින් නිකුත් කරනු ලැබූ සේවා සහතිකයක්.

ඉ. ආරක්ෂක සේවා/ජාතික/ජාත්‍යන්තර තේවල/කණ්ඩායම් ක්‍රීඩා තරග සඳහා සහභාගී වී ඇත්නම්, එය සනාථ කිරීම සඳහා එම සහතිකයන්හි ඡායා පිටපත් (ඒකක අණදෙන නිලධාරී සහ ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ විසින් සත්‍ය පිටපත් බවට සහතික කළ යුතුය)

ඊ. ජාතික/යුද්ධ හමුදා ක්‍රීඩා සංචිතයන් නියෝජනය කර ඇති හෝ දැනට නියෝජනය කරන අයවලුන් සිටී නම් එය සනාථ කිරීම සඳහා සංචිත භාර සභාපතිගේ අත්සනින් යුතුව ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

උ. ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිත තත්වයට පත් වී ඇති අයවලුන්ගේ ආබාධිත ප්‍රතිශතය සඳහා වෛද්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් ලබාගත් සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.

ඌ. අණදෙන නිලධාරී විසින් සහතික කරන ලද, පාසල වෙත ඇතුලත් කිරීමට නියමිත දරුවාගේ උප්පැන්න ලියාපදිංචි කිරීමේ ලේඛනයෙහි ඡායාස්ථ පිටපත හා දරු උපත වෙනුවෙන් පල කර ඇති 11 වන කොටසේ නියෝගය හෝ යුආපා 09 හි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

5. අ. මෙහි පහත සඳහන් ප්‍රදේශ හා කාලසීමාවන් ක්‍රියාන්විත ප්‍රදේශ වශයෙන් 2009.12.31 දින දක්වා පමණක් සැලකිය යුතු අතර, ඉන් පසුව ඉදිරියට සක්‍රිය සේවය ලෙස ගණනය කළ යුතුය. එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරීන් සඳහා දිවයිනෙන් බැහැරව සිටි කාලසීමාවන් පමණක් 2009.12.31 දිනෙන් පසුවද තවදුරටත් ඉදිරියට ක්‍රියාන්විත ප්‍රදේශ වශයෙන් ගණනය කළ යුතුය.

(1) උතුරු පළාත - මැලවව්විය සිට යාපනය අර්ධද්වීපය දක්වා.

දරුවාගේ උප්පැන්න ලියාපදිංචි කිරීමේ ලේඛනයෙහි ඡායාස්ථ පිටපත හා දරු උපත වෙනුවෙන් පල කර ඇති 11 වන කොටසේ නියෝගය හෝ යුආපා 09 හි ඡායා පිටපතක්

(2) නැගෙනහිර පලාත - මනම්පිටිය පාලමේ සිට වැලිකන්ද, වාකරේ, මාන්කේනි, ඵරාවූර් සහ මඩකලපුව දක්වා මහඔය අරන්තලාව, පුළුකුනාව බක්මී ඇල සහ අම්පාර යන දිස්ත්‍රික්ක.

(3) උතුරුමැද පලාත - හතරැස් කොටුවේ සිට ත්‍රිකුණාමලය දක්වා සහ ඉන් උතුරට (පදවිය, වැලිඔය, කෝකිලායි).

(4) වයඹ පලාත - පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව, එළුවන්කුලම, කෝස්වේ අනු බණ්ඩය (කලාවැව).

(5) 1994.11.18 වන දින සිට ඉදිරියට ජනාධිපති ආරක්ෂක අංශයේ රාජකාරී කළ කාලසීමාවන්

(6) 2005.12.01 දින සිට ඉදිරියට අගමැති ආරක්ෂක අංශයේ රාජකාරී කළ කාලසීමාවන්

(7) 2009.12.31 වන දින වනතුරු ආරක්ෂක ලේකම්/යුද්ධ හමුදාධිපති ආරක්ෂක අංශයේ රාජකාරී කළ කාලසීමාවන්

(8) එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් රාජකාරීන් සඳහා දිවයිනෙන් බැහැරව සිටි කාලසීමාවන්

ආ. <u>යුද්ධ හමුදා පුහුණු පාසල්</u>: දුෂ්කර ප්‍රදේශවල දැනට ක්‍රියාත්මකව පවතින හෝ ක්‍රියාත්මකව තිබූ පහත සඳහන් පුහුණු පාසල්හි සේවය කළ කාලසීමාව ක්‍රියාන්විත සේවා කාලය ලෙස ගණනය කරනු නොලැබේ.

(1) යුද්ධ හමුදා පුහුණු පාසල/විශේෂ බලකා පුහුණු පාසල.

(2) සටන් පුහුණු පාසල.

(3) කොම්පෑන් නොලන් නිලධාරී පුහුණු පාසල.

(4) පාබල පුහුණු මධ්‍යස්ථානය.

6. <u>විධායක ජෙනරාල් ශාඛාවේ ක්‍රියා පටිපාටිය</u>:

අ. නියමිත දිනට මණ්ඩල වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන රෙජිමේන්තු මධ්‍යස්ථාන වලට එරෙහිව ක්‍රියා කිරීම.

⟶ ආ. <u>මණ්ඩල</u>

ආ. <u>මණ්ඩල පත්කිරීම</u>: සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙතින් ඉදිරිපත් කරනු ලබන මණ්ඩල වාර්තා මගින් ඉදිරිපත් කරන සියලුම අයදුම්පත්හි ලකුණු පරීක්ෂා කර පරිගණක ගත කිරීම හා මියගිය අයවලුන්ගේ පාසල් තේරීම සඳහා පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල නියෝජනය වන පරිදි මණ්ඩල 02 ක් පත් කළ යුතු අතර, තාවකාලික ලකුණු නාම ලේඛන යුද්ධ හමුදා වෙබ් අඩවියේ පළ කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන සංශෝධන පරීක්ෂා කිරීම සඳහා වෙනම මණ්ඩලයක් ද පත් කළ යුතුය.

(1) වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය

(2) පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය

(3) වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය

(4) සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය

(අ) <u>පළමු මණ්ඩලයේ වගකීම හා කාර්යභාරය</u>

(i) රජයේ පාසල්/ආරක්ෂක සේවා විද්‍යාලයේ පළමු වන ශ්‍රේණිය වෙත ළමුන් ඇතුළත් කිරීමේ හමුදා නියෝගයට අනුව අයදුම්පත් නිසි අයුරු සම්පූර්ණ කර ඇති බවට පරීක්ෂා කර තහවුරු කර ගත යුතුය.

(ii) වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය/පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය/වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාදී ඇති දත්තයන් හා රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙතින් ඉදිරිපත් කර ඇති මණ්ඩල වාර්තාවේ ඇතුළත් ලකුණු සමඟ සංසන්දනය කර නිවැරදිතාවය තහවුරු කර ගැනීමෙන් අනතුරුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබාදී ඇති ආකෘති පත්‍රය අනුව ලකුණු පරිගණක ගත කළ යුතුය. යම් හෙයකින් එම ලකුණු වල පරස්පරතාවයන් ඇති වුවහොත් අදාළ අධ්‍යක්ෂ මණ්ඩල හා රෙජිමේන්තු මධ්‍යස්ථාන සමඟ සම්බන්ධතාවයෙන් එම නිරීක්ෂණයන් නිරාකරණය කිරීමට කටයුතු කළ යුතුය.

( iii) ආරක්ෂක සේවා විද්‍යාලයේ අයදුම්පත් ද මණ්ඩලය වෙතින් පරීක්ෂා කර අයදුම්කරුවන්ගේ ලකුණු ජ්‍යෙෂ්ඨතාවය අනුව ප්‍රමුඛතා ලේඛනය සකස් කළ යුතුය.(ජ්‍යෙෂ්ඨතා ලේඛන සැකසීමේදී මියගිය අයවලුන්ගේ දරුවන් සඳහා අනිවාර්යයෙන්ම පාසල් ලබාදිය යුතුය. ඔවුන් අතර, ජ්‍යෙෂ්ඨතාවය සැකසීමේදී දක්වා ඇති ලකුණු ලබාදීමේ ප්‍රතිපත්තින්ට අනුව උපයාගන්නා ලද සාමාන්‍ය ලකුණු පදනම් කර ගෙන ජ්‍යෙෂ්ඨතාවය සැකසිය යුතුය.)

→ ( iv) ක්‍රියාත්මක

(iv) ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක්ව මියගිය අයවලුන්හට උපරිම ලකුණු 10000 හිමි වේ. ඔවුන්හට පාසල් ලබාදීමේදී එක් පාසලක ඇති පුරප්පාඩු සංඛ්‍යාවෙන් 15% ප්‍රතිශතයකට යටත්ව පාසල් වෙන් කිරීම සිදු කළ යුතුය. ඔවුන් විසින් ඉල්ලුම් කරන ලද අයදුම්පතෙහි පිළිවෙලින් 01 සිට 04 දක්වා කැමැත්ත සඳහන් පාසල් පමණක් වෙන් කළ යුතුය. එම පාසල්හි යම් තරඟකාරීත්වයක් ඇති වුවහොත් ඔවුන්ගේ සේවා කාලයේදී හිමිව ඇති (ක්‍රියාන්විත සේවා කාලය, නිලය, පදක්කම්, ක්‍රීඩා දක්ෂතා, කාලාන්තරයා හා ආදි ශිෂ්‍ය/සහෝදර පදනම සඳහා උපයෝගන්නා ලද) සාමාන්‍ය ලකුණු ප්‍රමුඛත්වය අනුව 01 සිට 04 දක්වා කැමැත්ත සඳහන් පාසල් ලබාදී මණ්ඩල වාර්තා සැකසිය යුතුය.

(v) ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය එහෙත් යුද්ධ හමුදාධිපති නිගමනයේ රාජකාරියට අදාළ බව සඳහන්ව ඇති අයවලුන් සඳහා සාමාන්‍ය ලකුණු ලබාදීමේ ක්‍රමවේදයට අනුව ලකුණු ලබාදී, පාසල් වෙන් කර විශේෂ වරප්‍රසාදයක් වශයෙන් ඉල්ලුම් කර ඇති පාසල් 10 අතුරින් පිළිවෙලින් 1 සිට 6 දක්වා කැමැත්ත සඳහන් පාසල් පමණක් වෙන් කර මණ්ඩල වාර්තා සැකසිය යුතුය. ඔවුන්හට ක්‍රියාන්විතයේදී මියගිය අයහට හිමිවන ලකුණු 10000 හිමි නොවන අතර, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාසල් තේරීම සිදු කරනු ලබන්නේ ලකුණු ජ්‍යේෂ්ඨතාවය මත පරිගණකයෙන් පාසල් තෝරා දෙන ක්‍රමවේදයකට බැවින්, නම් කරන ලද පාසල් ලබාදීම සඳහා තාවකාලිකව ඔවුන් හට ලකුණු 10000 ක් ලබාදී මණ්ඩල වාර්තා සැකසිය යුතුය.

(vi) ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය, යුද්ධ හමුදාධිපති නිගමනයේ රාජකාරියට අදාළ නොවන බව සඳහන්ව ඇති අයවලුන් සඳහා සාමාන්‍ය ක්‍රමවේදයට අනුව ලකුණු ලබාදිය යුතුය.

(vii) යුද්ධ හමුදා සේවයේ යෙදී සිටියදී සියදිවි හානිකර ගත් අයවලුන්හට ලකුණු ලබාදීමේදී සාමාන්‍ය ලකුණු ලබාදීමේ ක්‍රමවේදය අනුව ඔවුන්ගේ ක්‍රියාන්විත සේවා කාලය, නිලය, පදක්කම්, ක්‍රීඩා දක්ෂතා, කාලාන්තරයා හා ආදි ශිෂ්‍ය/සහෝදර පදනම සඳහා හිමිව ඇති ලකුණු අනුව ගණනය කළ යුතුය.

(viii) අයදුම්පත් හා ලකුණු පරීක්ෂා කිරීමෙන් සහ පරිගණක ගත කිරීමෙන් අනතුරුව සකසන ලද මණ්ඩල වාර්තා රජයේ පාසල් හා ආරක්ෂක සේවා විද්‍යාලය වශයෙන් වෙන් වෙන්ව විධායක ජෙනරාල් ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) <u>දෙවන මණ්ඩලයේ වගකීම් හා කාර්යභාරය</u>

(i) මෙම හමුදා නියෝගයට අනුව අයදුම්පත් නිසි අයුරු සම්පූර්ණ කර ඇති බව පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් පසුව එම අයදුම්පත් හි A,B,C පිටපත් 03, මණ්ඩල සභාපති විසින් අත්සන් කළ යුතුය.

→ (ii) වැටුප්

(ii) වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය/පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය/වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාදී ඇති දත්තයන්, රෙජිමේන්තු මධ්‍යස්ථානයන් වෙතින් ලබාදී ඇති මණ්ඩල වාර්තා හා පළමු මණ්ඩලය වෙතින් සකසන ලද මණ්ඩල වාර්තා සංසන්ධනය කර නිවැරදිතාවය සනාථ කළ යුතු අතර, යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

( iii) රෙජිමේන්තු මධ්‍යස්ථාන හා පළමු මණ්ඩලයේ මණ්ඩල වාර්තා සංසන්දනය කිරීමෙන් අනතුරුව නිවැරදිව ලකුණු ජ්‍යෙෂ්ඨතාවය අනුව ආරක්ෂක සේවා විද්‍යාලයේ ප්‍රමුඛතා නාම ලේඛනය සකසා ඇති බවට සනාථ කිරීම හා යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

( iv) ක්‍රියාත්මක රාජකාරියේ යෙදී සිටියදී මියගිය/අතුරුදහන් අයවලුන් හා ක්‍රියාත්මක නොවන හේතුන් මත මියගිය එහෙත් යුද්ධ හමුදාධිපති නිගමනයේ රජකාරියට අදාළ බව සඳහන්ව ඇති අයවලුන් සඳහා පළමු මණ්ඩලය විසින් සකසන ලද ලකුණු හා පාසල් වෙන් කිරීම සංසන්දනය කර එහි නිවැරදිතාවය සනාථ කළ යුතුය. එම ලකුණු හා පාසල් වෙන් කිරීම පිළිබඳ පරස්පරතාවයක් ඇති වී ඇත්නම් එය නිවැරදි කර මණ්ඩල වාර්තා ඉදිරිපත් කළ යුතුය.

( v) ක්‍රියාත්මක නොවන හේතුන් මත මියගිය අයවලුන්ගේ යුද්ධ හමුදාපති නිගමනයේ රාජකාරියට අදාල නොවන බව සඳහන්ව ඇති අයවලුන් සඳහා සාමාන්‍ය ක්‍රමවේදයට අනුව ලකුණු සකසා ඇති බවට සනාථ කිරීම හා යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

( vi) යුද්ධ හමුදා සේවයේ යෙදී සිටියදී සියදිවි හානිකර ගත් අයවලුන්හට ලකුණු ලබාදීමේදී සාමාන්‍ය ක්‍රමවේදයට අනුව ලකුණු සකසා ඇති බවට සනාථ කිරීම හා යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

( vii) අයදුම්පත් හා ලකුණු පරීක්ෂා කිරීමෙන් අනතුරුව සකසන ලද මණ්ඩල වාර්තා රජයේ පාසල් හා ආරක්ෂක සේවා විද්‍යාලය වෙන් වෙන් වශයෙන් විධායක ජෙනරාල් ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඇ) <u>ලකුණු සංශෝධන මණ්ඩලයේ වගකීම හා කාර්යභාරය</u>

(i) දෙවන මණ්ඩල වාර්තාවට අනුව සකසන ලද ලකුණු යුද්ධ හමුදා වෙබ අඩවියේ පලකිරීමෙන් පසුව ලබාදෙනු ලබන සංශෝධන කාලය තුළ වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය/පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය/වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලබාදෙනු ලබන සංශෝධනයන් පරීක්ෂා කර බලා ඒ අනුව ලකුණු සකසා මණ්ඩල වාර්තාව සකස් කර විධායක ජෙනරාල් ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතුය.

→ ඇ. මණ්ඩල

ඇ. මණ්ඩල මගින් අයදුම්පත් හා ලකුණු පරීක්‍ෂා කිරීමෙන් අනතුරුව සකසන ලද මණ්ඩල වාර්තා සහ සංශෝධිත ලකුණු ඇතුලත් මණ්ඩල වාර්තා විධායක ජෙනරාල් ශාඛාව වෙත ලැබීමෙන් පසු රාජ්‍ය ආරක්‍ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත සහ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාරදීමට ඇවැයි අනුමැතිය සුහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදිය යුතුය.

7. <u>ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියා පිළිවෙත</u>: ඒකක අණදෙන නිලධාරි සහතික කිරීමෙන් අනතුරුව රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙතින් ඉදිරිපත් කරනු ලබන ක්‍රීඩා සහතිකපත්හි ඡායාපිටපත්වල නිවැරදිතාවය සනාථ කර ගැනීමෙන් අනතුරුව ක්‍රීඩා අධ්‍යක්ෂක විසින් සහතික කර රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත කඩිනමින් ලබා දිය යුතුය. එම ක්‍රීඩා සහතිකපත්හි සඳහන් තරගාවලිය හා ලබා ඇති ස්ථානය ඇතුලත්ව සම්පූර්ණ නාම ලේඛණය අදාල වර්ෂයේ ජූලි මස 15 වන දිනට ප්‍රථම ක්‍රීඩා අධ්‍යක්ෂකගේ අත්සනින් යුතුව සුහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය.

8. <u>වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියා පිළිවෙත</u>: සුහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් මූලික විස්තර ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන්ගේ යුද්ධ හමුදාවට බැඳුනු දිනය/නිවාඩු නොමැතිව නොපැමිණි දින ගණන අදාල වර්ෂයේ මැයි 31 වන දින දක්වා කාලය ආවරණය වන පරිදි ගණනය කල යුතුය. ක්‍රියාත්මක සේවයේ දින ගණන 2009.12.31 දින දක්වා පමණක් ගණනය කල යුතු අතර, එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් රාජකාරීන් සඳහා දිවයිනෙන් බැහැරව සිටි කාලසීමාවන් පමණක් 2009.12.31 දිනෙන් පසුවද තවදුරටත් ඉදිරියට ක්‍රියාත්මක ප්‍රදේශ වශයෙන් අදාල වර්ෂයේ මැයි 31 වන දින දක්වා ගණනය කල යුතුය. ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිතව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වා ඇත්නම් එම දිනයද ඇතුළුව රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත අදාල වර්ෂයේ ජූනි මස 30 දිනට ප්‍රථම ලබාදී එහි පිටපතක් අධ්‍යක්ෂ වැටුප් හා ලේඛණගේ ආවරණ ලිපියක් මගින් සුහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදීමට කටයුතු කල යුතුය. ජනාධිපති ආරක්‍ෂක ඒකකය, අගමැති ආරක්‍ෂක අංශය, ආරක්‍ෂක ලේකම් ආරක්‍ෂක අංශය සහ යුද්ධ හමුදාධිපති ආරක්‍ෂක ඒකකයන් හි රාජකාරි කල අයවලුන්ගේ එම සේවා කාලය ක්‍රියාත්මක සේ ගණනය කල යුත්තේ 2009.12.31 වන දින දක්වා පමණක් වන අතර, එය රෙජිමේන්තු සමග සම්බන්ධතාවයෙන් සොයා බලා ගණනය කල යුතුය. තවද, ඇතිවන ගැටලු සහගත තත්ත්වයන් රෙජිමේන්තු සමග සම්බන්ධතාවයෙන් නිරාකරණය කර එහි පිටපතක් සුහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය.

9. <u>පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියා පිළිවෙත</u>: සුහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් මූලික විස්තර ඉදිරිපත් කරනු ලබන අයවලුන්ගේ පදක්කම් විස්තර ඇතුලත් නාම ලේඛන ඇතුළුව රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත පිරිස් පරිපාලන අධ්‍යක්ෂගේ ආවරණ ලිපියක් මගින් මැයි මස 25 වන දිනට ප්‍රථම ඉදිරිපත් කර එහි පිටපතක් සුහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය. රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත ලබාදෙනු ලබන පදක්කම් විස්තර පරීක්‍ෂා කිරීමෙන් පසු ඇති වන ගැටලු නිරාකරණය කිරීම සඳහා ඇතුළුව රෙජිමේන්තු සමග සම්බන්ධතාවයෙන් කටයුතු කර එහි පිටපතක්ද සුහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදිය යුතුය.



10. <u>වෛද්‍ය සේවා</u>

10. <u>වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියා පිළිවෙත:</u> පුහුසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් මූලික විස්තර ඉදිරිපත් කරනු ලබන යුද්ධ හමුදා සාමාජිකයින් අතුරින් ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත්ව ඇති අයවලුන් සිටී නම් ඒ පිළිබඳ සොයා බලා ඔවුන්හට ගිම් ගන්වා ඇති ආබාධිත ප්‍රතිශතයන් සමඟ ආබාධිතව වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගන්වා ඇති අයවලුන්ගේ තුවාල වූ දිනය හා විශ්‍රාම ගැන්වූ දිනය ඇතුළුව නාම ලේඛන ඉදුරාම රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත අදාල වර්ෂයේ මැයි මස 25 වන දිනට ප්‍රථම ලබාදිය යුතුය. එහි පිටපතක් වෛද්‍ය සේවා අධ්‍යක්ෂගේ ආවරණ ලිපියක් මඟින් පුහුසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දිය යුතු අතර, ඇතිවන ගැටලු සහගත තත්ත්වයන් රෙජිමේන්තු සමඟ සම්බන්ධතාවයෙන් නිරාකරණය කර එහි පිටපතක්ද පුහුසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

11. <u>පුහුසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියා පිළිවෙත:</u>

අ. රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙතින් අදාළ වර්ෂයේ මාර්තු 15 වන දිනට ප්‍රථම ඉදිරිපත් කරනු ලබන මූලික විස්තර කවිතමින් වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය/පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය/වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා රෝහල වෙත ඉදිරිපත් කළ යුතුය. එම අධ්‍යක්ෂ මණ්ඩල වෙතින් ලබාදෙනු ලබන සියලුම දත්තයන් හා රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙතින් ලබාදෙනු ලබන මණ්ඩල වාර්තා සියල්ලම නිවැරදිව විධායක ජෙනරාල් ශාඛාව වෙතින් පත් කරනු ලබන ලකුණු පරීක්ෂා කිරීමේ පළමු මණ්ඩලය වෙත යොමු කළ යුතුය. පළමු මණ්ඩල වාර්තාව විධායක ජෙනරාල් ශාඛාව වෙත ඉදිරිපත් කර අනුමත කර ගැනීමෙන් අනතුරුව දෙවන මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. දෙවන මණ්ඩල වාර්තාව විධායක ජෙනරාල් ශාඛාව වෙතින් අනුමත කර ගැනීමෙන් අනතුරුව අවසන් ලකුණු ලේඛනය සහ අයදුම්පත් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත භාරදිය යුතුය. (එම අවසන් ලකුණු ලේඛනයේ පිටපතක් විධායක ජෙනරාල් ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතුය)

ආ. දෙවන මණ්ඩලය වෙතින් ලබා දෙනු ලබන ලකුණු ලේඛනය යුද්ධ හමුදා වෙබ් අඩවියේ පළ කිරීම සඳහා ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දිය යුතුය. එම ලකුණු වල පරස්පරතාවයක් ඇත්නම් සංශෝධන සඳහා අයදුම්කරුවන් වෙත දින 14 ක කාල පරාසයක් ලබා දී ඒ සබැඳිව ලිඛිතව රෙජිමේන්තු මධ්‍යස්ථාන දැනුවත් කළ යුතු අතර, එම ලකුණු ලේඛනය අඩංගු සංයුක්ත තැටියක් රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත ලබාදිය යුතුය.

ඇ. සංශෝධන කාල පරාසය තුළ අයදුම්කරුවන් විසින් රෙජිමේන්තු මධ්‍යස්ථාන හරහා වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය/පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය/වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා රෝහල වෙත ඉදිරිපත් කරනු ලබන ගැටලු නිරාකරණය කිරීමෙන් අනතුරුව එම අධ්‍යක්ෂ මණ්ඩල වෙතින් ඉදිරිපත් කරනු ලබන සංශෝධන අනුව ලකුණු සකස් කිරීම සඳහා සංශෝධන මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර, එම සංශෝධිත ලකුණු ඇතුළත් මණ්ඩල වාර්තාව විධායක ජෙනරාල් ශාඛාවේ අනුමැතියෙන් පසු රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට ක්‍රියා කළ යුතුය.

→ ඈ. අධ්‍යාපන

ඈ. අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් අයදුම්කරුවන් සඳහා පාසල් වෙන් කරන ලද තාවකාලික පාසල් ලේඛනය සුහසාධක අධ්‍යාපන මණ්ඩලය වෙත ලැබීමෙන් පසුව යුද්ධ හමුදා වෙබ් අඩවියේ පළ කළ යුතුය. එම පාසල් ලේඛනය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ලබාදී ඇති පාසල් පිළිබඳව ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අයදුම්කරුවන් වෙත රෙජිමේන්තු මධ්‍යස්ථාන හරහා අභියාචනා ඉදිරිපත් කිරීමට දින 14 ක කාල පරාසයක් ලබා දී ඒ සම්බන්ධව ලිඛිතව රෙජිමේන්තු මධ්‍යස්ථාන දැනුවත් කළ යුතු අතර, තාවකාලික පාසල් ලේඛනය අඩංගු සංයුක්ත තැටියක් රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත ලබාදිය යුතුය.

ඉ. රෙජිමේන්තු මධ්‍යස්ථාන හරහා අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා ක්‍රියාකර යම් සංශෝධනයක් සිදු කිරීමට ඇත්නම් එම සංශෝධන විධායක ජෙනරාල් ශාඛාවට පිටපත් සහිතව රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

ඊ. අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් අයදුම්කරුවන් සඳහා පාසල් වෙන් කරන ලද අවසන් ලේඛනය සුහසාධක අධ්‍යාපන මණ්ඩලය වෙත ලැබීමෙන් පසුව යුද්ධ හමුදා වෙබ් අඩවියේ පළ කිරීම සඳහා ජනමාධ්‍ය අධ්‍යාපන මණ්ඩලය වෙත ලබා දිය යුතුය. ඒ සම්බන්ධව ලිඛිතව රෙජිමේන්තු මධ්‍යස්ථාන දැනුවත් කළ යුතු අතර, අවසන් පාසල් ලේඛනය අඩංගු සංයුක්ත තැටියක් රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත ලබාදිය යුතුය.

උ. කිසිදු පාසලක් වෙන්කර දී නොමැති අයදුම්කරුවන්හට පුරප්පාඩු පවතින් පාසල් සඳහා අයදුම්කරුගේ කැමැත්ත අනුව පාසල් ලබා දීමට කටයුතු කළ යුතුය. එක් පාසලක පවතින පුරප්පාඩු සඳහා යම් තරඟකාරීත්වයක් ඇති වුවහොත් ලකුණු ජ්‍යෙෂ්ඨතාවය අනුව පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය.

12. <u>රෙජිමේන්තු ක්‍රියා පිළිවෙත :</u>

අ. සියලුම ඒකක අණදෙන නිලධාරීන් දැනුවත් කර තම ඒකකයට අයත් ඉහත ඡේද අංක 2 හි සඳහන් සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන්ගේ මූලික විස්තර හා අයදුම්පත් නියමිත දිනයන්ට ප්‍රථම රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

ආ. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන මූලික විස්තර අණදෙන නිලධාරීගේ හා මධ්‍යස්ථාන සේනාවිධායකගේ අත්සනින් යුතුව අදාළ වර්ෂයේ මාර්තු මස 15 වන දිනට ප්‍රථම එම විස්තර ඇතුලත් සංයුක්ත තැටියක් සමඟ සුහසාධක අධ්‍යාපන මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. එම මූලික විස්තර ඉදිරිපත් කිරීමේදී ඉහත ඡේද අංක 3 හි "අ" උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

→ ඇ. වැටුප් හා

ඇ. වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය/පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය/වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා රෝහල වෙතින් ලබා දෙනු ලබන දත්තයන්, සෑම රෙජිමේන්තුවකම මධ්‍යස්ථාන සේනාවිධායකගෙන් සැදුම්ලත් මණ්ඩලයක් විසින් පරීක්ෂා කර අයදුම්කරුවන්ගේ ලකුණු සකස් කර රෙජිමේන්තු අධිපති/බලකාධිපතිගේ නිර්දේශයෙන් යුතුව මණ්ඩල වාර්තාව හා එය ඇතුලත් සංයුක්ත තැටියක්ද සමඟ අයදුම්පත් සෑම වසරකම ජූලි මස 15 වන දිනට ප්‍රථම සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත රජයේ පාසල් හා ආරක්ෂක සේවා විද්‍යාලය වශයෙන් වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතුය. එම මණ්ඩල වාර්තා සැකසීමේදී හා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ඉහත ඡේද අංක 3 හි "ආ" සහ "ඇ" හි දක්වා ඇති පරිදි ක්‍රියා කළ යුතුය.

ඈ. නියමිත දිනට මණ්ඩල වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ඒ පිළිබඳව මධ්‍යස්ථාන සේනාවිධායක විසින් ඉදුරාම වගකිව යුතුය.

ඉ. විධායක ජෙනරාල්ගේ අනුමැතියෙන් පසු දෙවන මණ්ඩලයේ ලකුණු ලේඛනය යුද්ධ හමුදා වෙබ් අඩවියේ පළ කිරීමෙන් පසු සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලකුණු සංශෝධන සඳහා ලබාදෙනු ලබන කාල පරාසය තුළ අයදුම්කරුවන් වෙත පැන නගින ගැටලු සහගත තත්ත්වයන් අදාළ අධ්‍යක්ෂ මණ්ඩල සමඟ සම්බන්ධතාවයෙන් නිරාකරණය කළ යුතුය. සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ලකුණු සංශෝධනය සඳහා ලබා දෙනු ලබන කාල පරාසයෙන් පසුව සංශෝධනයන් ඉදිරිපත් නොකළ යුතුය.

ඊ. අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් ලබාදෙන පාසල් වෙන් කිරීමේ තාවකාලික ලේඛනය යුද්ධ හමුදා වෙබ් අඩවියේ පළ කිරීමෙන් පසු සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් පාසල් සංශෝධන සඳහා ලබාදෙනු ලබන කාල පරාසය තුළ පාසල් වෙන් කර ඇති සහ නැති අයදුම්කරුවන්ගේ අභියාචනා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා ලබා දෙනු ලබන කාල පරාසයෙන් පසුව අභියාචනා ඉදිරිපත් නොකළ යුතුය.

උ. පාසල් වෙන් කිරීමේ අවසන් ලේඛනය යුද්ධ හමුදා වෙබ් අඩවියේ පළ කිරීමෙන් පසු තම රෙජිමේන්තුවට අයත් අයදුම්කරුවන්ගේ දරුවන් වෙන් කර දී ඇති පාසල් වෙත ඇතුලත් කර ඇති බව තහවුරු කර ගත යුතුය.

ඌ. අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් වෙන් කරන ලද පාසල් වෙත තම දරුවන් ඇතුලත් නොකරන අයවලුන්ගේ නාම ලේඛනය එම පාසලද ඇතුලත්ව අදාළ වර්ෂයේ ජනවාරි මස 31 වන දිනට ප්‍රථම සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මධ්‍යස්ථාන සේනාවිධායකගේ අත්සනින් ඉදිරිපත් කළ යුතුය.

13. <u>අයදුම්කරුවන් වෙත ලකුණු ලබාදීමේ පිළිවෙත</u>: ඕනෑම සාමාජිකයෙකුහට ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 10000 කි.

→ අ. යුද්ධ හමුදා

අ. යුද්ධ හමුදා සේවය සඳහා එක් දිනකට ලකුණු 0.137 බැගින් උපරිම වසර 20 ක් සඳහා ලකුණු 1000 යි.

ආ. ක්‍රියාන්විත සේවා කාලය සඳහා එක් දිනකට ලකුණු 0.821 බැගින් උපරිම වසර 15 ක් සඳහා ලකුණු 4500 යි.

ඇ. එක් එක් නිලයන් සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබාදිය යුතුය. උපරිම ලකුණු 500 යි.

| | | | | | |
|---|---|---|---|---|---|
| කර්නල් නිලයේ සිට ඉහලට | - | 500 | බලලත් නිලධාරී I | - | 350 |
| ලුතිනන් කර්නල් | - | 450 | බලලත් නිලධාරී II | - | 300 |
| මේජර් | - | 400 | මාණ්ඩලික සැරයන් | - | 200 |
| කපිතාන් /ලුතිනන් | - | 350 | සැරයන් | - | 150 |
| ලුතිනන් (උපා) | - | 350 | කෝප්‍රල්/ ලා/කෝ | - | 100 |
| දෙවන ලුතිනන් /උපපති | - | 300 | සාමාන්‍ය සෙබළ | - | 50 |

ඇ. පදක්කම් ලබා ඇති වාර ගණනට අනුව උපරිම ලකුණු 1500 ට යටත්ව ලකුණු ලබාදිය යුතුය.

| | | |
|---|---|---|
| පරම වීර විභූෂණය | - | 1500 |
| විරෝධාර විභූෂණය | - | 1200 |
| වීර වික්‍රම විභූෂණය | - | 900 |
| රණ වික්‍රම පදක්කම | - | 600 |
| රණශූර පදක්කම | - | 300 |
| දේශපුත්‍ර පදක්කම | - | 100 |

ඉ. (1) ආරක්ෂක සේවා/ජාතික/ජාත්‍යන්තර තේවල/කණ්ඩායම් ක්‍රීඩා තරඟ සඳහා සහභාගී වී ඇත්නම් ඒ සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබාදිය යුතුය. උපරිම ලකුණු සංඛ්‍යාව ලකුණු 1000 කි.

| | රන් | රිදී | ලෝකඩ |
|---|---|---|---|
| ඔලිම්පික් ක්‍රීඩා උළෙල/ලෝක ශූරතා තරඟාවලි | - 1000 | 900 | 800 |
| පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙල | - 750 | 725 | 700 |
| ආසියානු ක්‍රීඩා තරඟ/ආසියානු පැරා ක්‍රීඩා තරඟ | - 650 | 625 | 600 |
| සාෆ් ක්‍රීඩා උළෙල | - 575 | 550 | 525 |
| ලෝක හමුදා ක්‍රීඩා තරඟ | - 500 | 475 | 450 |
| දකුණු ආසියාතික යුද්ධ හමුදා ක්‍රීඩා තරඟ | - 425 | 400 | 375 |
| ජාතික මට්ටමේ ක්‍රීඩා තරඟ | - 275 | 250 | 225 |
| ආරක්ෂක සේවා ක්‍රීඩා තරඟ | - 200 | 175 | 150 |

(2) ඉහත ක්‍රීඩා තරඟාවලදී ලබාගන්නා ලද සහතිකපත්හි රන්, රිදී, ලෝකඩ පදක්කම් වෙනුවට එය පළමු, දෙවන හා තෙවන ස්ථානය වශයෙන් සටහන්ව ඇත්නම් අනුපිළිවෙලින් ඉහත ආකාරයට ලකුණු ගණනය කළ යුතුය.

⟶ (3) අවස්ථා

(3) අවස්ථා කිහිපයකදී යම් අයදුම්කරුවෙකු තරඟ කිහිපයකින් ජයග්‍රහණ ලබා ඇත්නම් එම ජයග්‍රහණ අනුව ලකුණු උපරිම 1000 කට යටත්ව ගණනය කළ යුතුය.

(4). ජයග්‍රහණය නොලබා එම තරඟාවලි සඳහා සහභාගිවී සහතිකපත් ලැබුවන්ට පමණක් උපරිම ලකුණු 75 ක් සහ ජාතික/යුද්ධ හමුදා ක්‍රීඩා සංචිතයන් නියෝජනය කර ඇති/දැනට නියෝජනය කරන අයවලුන් සඳහා පමණක් උපරිම ලකුණු 50 යි.

(5) යුද්ධ හමුදා සේවා කාලය තුළදී ලැබූ ජයග්‍රහණයන් සඳහා පමණක් ලකුණු ලබාදිය යුතුය.

ඊ. දෙමව්පියන් පළමු කැමත්ත සඳහන් පාසලේ ආදි ශිෂ්‍යයෝ නම් ලකුණු 125. (සනාථ කිරීම සඳහා විදුහල්පති සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.)

උ. ඇල්ලුම් කරන පළමු කැමැත්ත සඳහන් පාසලේ සහෝදර සහෝදරයින් ඉගෙනුම ලබයි නම් ලකුණු 125 යි. (සනාථ කිරීම සඳහා විදුහල්පති සහතිකයේ මුල් පිටපත සමග අණදෙන නිලධාරී විසින් සහතික කරන ලද ඉගෙනුම ලබන දරුවාගේ උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

ඌ. අයදුම්පත ඉදිරිපත් කර ඇති යුද්ධ හමුදා සාමාජිකයාගේ කාලාතුයා යුද්ධ හමුදා සේවයේ අයෙකු නම් ඔහුගේ/ඇයගේ යුද්ධ හමුදා සේවා කාලය වසර 05 ක් සම්පූර්ණ කර ඇති බවට වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සනාථ කර ඇත්නම් ලකුණු 250 යි. (කාලාතුයා අයත් ඒකක අණදෙන නිලධාරී විසින් සේවා සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)

එ. <u>ආබාධිත අයවලුන් සඳහා ලකුණු ලබාදීමේ ක්‍රියා පිළිවෙත:</u> ආබාධිත අයවලුන් සඳහා ආබාධිත ප්‍රතිශතය අනුව 1:10 අනුපාතයට උපරිම ලකුණු 1000 ක් හිමිගැන්වේ. (අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂය තුළ යුද්ධ හමුදා රෝහල වෙතින් ලබාගත් ආබාධිත ප්‍රතිශතය සඳහන් සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.) ආබාධිතව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වූ අයවලුන්හට ලබාදෙන ලකුණු හා සමානව සාධාරණ ලකුණු සංඛ්‍යාවක් ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධිතව දැනට සේවයේ යෙදී සිටින අයවලුන්හටද ලබාදිය යුතු බැවින්, පහත සඳහන් පරිදි ලකුණු ගණනය කළ යුතුය.

(1) ක්‍රියාන්විත සේවය <u>අවු: 15 ක් සම්පූර්ණ කර ඇති</u> 100% ක ආබාධිත ප්‍රතිශතයක් ඇති වසර 20 ක යුද්ධ හමුදා සේවා කාලයක් සම්පූර්ණ කර දැනට සේවයේ යෙදී සිටින අයෙකු සඳහා ලකුණු ලබාදීමේ පිළිවෙත.

උදා :-

| | | |
|---|---|---|
| යුද්ධ හමුදා සේවා කාලය සඳහා (දිනකට 0.137 x වසර 20) | ලකුණු | 1000 (උපරිම) |
| ක්‍රියාන්විත සේවා කාලය සඳහා (දිනකට 0.821 x වසර 15) | ලකුණු | 4500 (උපරිම) |
| නිලය සඳහා | ලකුණු | 500 (උපරිම) |
| පදක්කම් සඳහා | ලකුණු | 1500 (උපරිම) |
| ක්‍රීඩා සඳහා | ලකුණු | 1000 (උපරිම) |
| ආබාධිත ප්‍රතිශතය සඳහා {100% ක් ආබාධිත(100 x 10)} | ලකුණු | 1000 (උපරිම) |
| ආදි ශිෂ්‍ය පදනම සඳහා | ලකුණු | 125 |
| සහෝදර පදනම සඳහා | ලකුණු | 125 |
| කාලාතුයා සඳහා | ලකුණු | 250 |
| **මුළු ලකුණු** | | 10000 |



→ (2) ක්‍රියාන්විත

(2) ක්‍රියාන්විත සේවයේ <u>අවු: 15 ක් සම්පූර්ණ කර නොමැති</u> ආබාධිත ප්‍රතිශතය 100% ක් ලබා ඇති වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කර දැනට සේවයේ යෙදී සිටින අයෙකු සඳහා ලකුණු ලබාදීමේ පිළිවෙත.

උදා :-

| | |
|---|---|
| යුද්ධ හමුදා සේවා කාලය සඳහා (දිනකට 0.137 x වසර 20) | ලකුණු 1000 (උපරිම) |
| නිළය සඳහා | ලකුණු 500 (උපරිම) |
| පදක්කම් සඳහා | ලකුණු 1500 (උපරිම) |
| ක්‍රීඩා සඳහා | ලකුණු 1000 (උපරිම) |
| ක්‍රියාන්විත/ආබාධිත ප්‍රතිශතය සඳහා (4500 x 100% ÷ 100) | ලකුණු 4500 (උපරිම) |
| ආබාධිත ප්‍රතිශතය සඳහා {100% ක් ආබාධිත(100 x 10)} | ලකුණු 1000 (උපරිම) |
| ආදි ශිෂ්‍ය පදනම සඳහා | ලකුණු 125 |
| සහෝදර පදනම සඳහා | ලකුණු 125 |
| කාලාශ්‍රයා සඳහා | ලකුණු 250 |
| මුළු ලකුණු | 10000 |

**සැලකිය :-** අබාධිත වී තවදුරටත් සේවයේ යෙදී සිටින අයවලුන්ගේ සේවය ඇගයීමක් වශයෙන් ක්‍රියාන්විත ලකුණු ලබාදීමේදී ක්‍රියාන්විත සේවා කාලයේදී උපයා ගන්නා ලද ලකුණු වලට පහත සඳහන් සමීකරණය පරිදි ලකුණු ගණනය කර එම ලකුණු ප්‍රමාණයද ක්‍රියාන්විත ලකුණු වලට එකතු කළ යුතුය. එසේ සිටීමේදී ක්‍රියාන්විත ලකුණු උපරිම 4500 තුළ තිබිය යුතුය. එයට අමතරව ආබාධිත ප්‍රතිශතය සඳහා 1:10 අනුපාතය අනුව ලකුණු ලබාදිය යුතුය.

4500 x ආබාධිත ප්‍රතිශතය ÷ 100 = ලකුණු
(උපරිම ක්‍රියාන්විත ලකුණු x ආබාධිත ප්‍රතිශතය ÷ 100 = ලකුණු )

ජ. <u>ආබාධිතව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වා ඇති අයවලුන් සඳහා ලකුණු ලබාදීම</u>

(1) ආබාධිතව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වා ඇති අයවලුන් සඳහා ක්‍රියාන්විත ප්‍රදේශ වෙනුවෙන් ලකුණු ලබාදීමේදී ඔවුන් සේවය කල ක්‍රියාන්විත දින ගණනට අමතරව විශේෂ වරප්‍රසාදයක් වශයෙන් තුවාල වූ දින සිට **2009.12.31** දිනට පෙර ආබාධිත විශ්‍රාම ගැන්වූ අයවලුන් සඳහා එම ආබාධිත විශ්‍රාම ගැන්වූ දිනය දක්වාත්, තුවාල ලබා **2009.12.31** දිනෙන් පසු ආබාධිත විශ්‍රාම ගැන්වූ අයවලුන් සඳහා **2009.12.31** දින දක්වා පමණක් ආවරණය වන පරිදි ක්‍රියාන්විත සේවය ලෙස ගණනය කර එක් දිනකට ලකුණු **0.821** ක ප්‍රමාණයක් උපරිම වසර **15** ක් දක්වා ලබාදිය යුතුය.

(2) ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබා ආබාධිතව විශ්‍රාම ගන්වා ඇති අයවලුන් සඳහා ලබාදී ඇති විශේෂ වරප්‍රසාදයක් වශයෙන් අබාධිත ප්‍රතිශතයට අනුව **01:10** අනුපාත ක්‍රමයටද අනුව ලකුණු ලබාදීම සිදු කරයි.

→ ((3) ක්‍රියාන්විත

(3) ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී සිතාමතා තමා විසින්ම තුවාල සිදු කර ගැනීමෙන්/වෙඩිතබා ගැනීමෙන් ආබාධිත තත්ත්වයට පත්විම හෝ ක්‍රියාන්විත රාජකාරියට අදාළ නොවන අනෙකුත් හේතුන් මත ආබාධිත වී ඇත්නම් ආබාධිත තත්ත්වයට හිමි ලකුණු නොලැබේ.

ඖ. <u>මියගිය අයවලුන් සඳහා ලකුණු ලබාදීම:</u> ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්ථවාදී ප්‍රහාරයකට ලක්ව මියගිය අයවලුන් සඳහා ලකුණු <u>10000</u> යි.

ඕ. ජාතික මිනිස්බල සංචිතයේ සහ ජාතික සහයක බලසේනාවේ සේවය කර යුද්ධ හමුදාව වෙත බැදුනු අයවලුන්ගේ පෙර සේවා කාලය වලංගු වන්නේ විශ්‍රාමික වැටුප සඳහා පමණි. ඉහත ආයතනවල රාජකාරී කළ <u>කාලසීමාව ගණන් නොගත</u> යුතු බැවින් මේ පිළිබඳව ඒකක අණදෙන නිලධාරීන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

ක. ඉදුරාම බඳවාගත් අයවලුන්ගේ වෘත්තීමය දැනුම හා පලපුරුද්ද සඳහා දක්වන අනුග්‍රහයක් වශයෙන් යුද්ධ හමුදා සේවා කාලය සඳහා වන ලකුණු ලබාදිමේදී ඔවුන් රජයේ ආයතනයක කරන ලද සේවා කාලයද ගණනය කරනු ලැබේ. මේ සඳහා ලකුණු ලබාදිමට එම අයවලුන් විසින් තමන් කරන ලද සේවය හා එම සේවා කාලය සඳහන් කර අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන සහතිකයක් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුවේ.

ග. නිවාඩු නොමැතිව නොපැමිණි හමුදා සාමාජිකයින් සඳහා එම නොපැමිණි කාලසීමාව අනුව ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාවෙන් පහත සඳහන් ප්‍රමාණය අඩු කළ යුතුය.

| | | |
|---|---|---|
| (1) | දින 21 සිට අවු: 01 දක්වා | - 500 |
| (2) | අවු: 01 සිට අවු: 02 දක්වා | - 750 |
| (3) | අවු: 02 සිට අවු: 03 දක්වා | - 1000 |
| (4) | අවු: 03 සහ ඊට වැඩි | - 1500 |

14. <u>ඉල්ලුම්පත් සහතික කිරීම:</u>

අ. මේජර් නිලයේ (අණදෙන නිලධාරී නොවන සහ මාණ්ඩලික නිලධාරී I තනතුර නොවන) සහ ඊට පහළ නිලයේ නිලධාරීන්ගේ සහ සෙසු නිලයින්ගේ අයදුම්පත් ඒකක අණදෙන නිලධාරී විසින් සහතික කිරීමෙන් පසුව රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක විසින් සහතික කළ යුතුය. (වෙනුවට සහතික කිරීම නොකළ යුතුය)

ආ. අණදෙන නිලධාරී හෝ මාණ්ඩලික නිලධාරී I තනතුර දරන මේජර් නිලයේ නිලධාරීන්, ලුතිනන් කර්නල් සහ ඊට ඉහළ නිලධාරීන්ගේ අයදුම්පත් රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක විසින් සහතික කළ යුතුය.

→ 15. 2014 වර්ෂයේ

15. 2014 වර්ෂයේ සිට ඉදිරියට යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දරුවන් රජයේ පාසල්වලට සහ ආරක්ෂක සේවා විද්‍යාලයේ පළමු වන ශ්‍රේණියට ඇතුලත් කිරීමේදී මෙම නියෝගයේ සඳහන් ප්‍රතිපත්ති සහ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ.

ජීවී රවිප්‍රිය
බ්‍රිගේඩියර්
පිරිස් පරිපාලන අධ්‍යක්ෂ

යුද්ධ හමුදා මූලස්ථානය
තැ. පෙ. 553
කොළඹ

2013 මාර්තු මස 19 දින

**බෙදාහැරීම :**

සියලුම ඒකක (ශ්‍රීලංනාග හා ශ්‍රීලංගුහ හැර)